

# සුගතොවාද
# සංග්‍රහය.

# සුගතනො වාද සංග්‍රහව.

නොහොත්

භික්ෂූන්ගේ නිත්මීම.

---

උගත් ස්වාමින්වහන්සේ කෙනෙක් ලවා

සම්පාදනයකොට

ඒ. පී. සි ත්ද මැත්දිස් එන මම

විසින්

ලඞ්කාධාර යන්ත්‍රාලයේදී

අච්චුගස්සා ප්‍රසිද්ධකරනලදී.

මෙහි අයිතිවාසිකම මටම තබාගන්නෙමි

1900

ගෙණ නොකටයුතු හැර කටයුතු ගෙණ අසෙවිත ව්‍යය හැර සෙවිතව්‍යය ගෙණ සුගතොවාදයෙහි පිහි ටා අත්වැඩ පරවැඩසැදීම ප්‍රයොජන වන්නාහුයි—

එහි පළමුකොට දෘෂ්ටිය ඍජුවීම ප්‍රයොජනකොට ඇතිබැවින් අප බුදුන්ගේ සුගත ගුණයට ඇතුළත් වූ අභිනිහාරය සංක්‍ෂෙපයෙන් මෙහි දක්වනු ලැබේ.

කෙසේදයත්

සුගත තථාගත වර ධර්ම චක්‍රවර්ති ඒ භාග්‍යවත් අභිත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෙත්තමයානන්වහ න්සේ විසින් බෝමැඩ සමීපයෙහිම සත්සතියැවා අට වැනි සතියෙහි අජපල් නුගමුල වැඩහිඳ ධර්ම ගාම්භී ර්‍ය්‍යය සලකා දේශනාකිරීමෙහි මන්දෝත්සාහයට පැමිණිකල්හි දසදහසක් සක්වල මහාබ්‍රහ්මයන් පිරිවරණලද සහම්පති මහාබ්‍රහ්මයාවිසින් "නස්ස තිච්නගො ලොකො විනස්සති වතභො ලොකො" යනාදීන් කියා ධර්ම දෙශනාවට ආරාධනා කළසේක් බුදුඇසින් ලොව බලා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ ඇ සලමස පුණු පොහෝදින බරණැස ඉසිපතනයට වැඩ පස්වග මහණුන් ප්‍රධානකොට ඇති අටලොස් කෙළක් බ්‍රහ්මයන්ට ධර්මාමෘත පානය කරවමින් දම් සක්පැවතුම් සූත්‍ර දෙශනාව වදරා එතැන්පටන් පන් සාළිස් හවුරුද්දක් මුලුල්ලෙහි සතරමර ලොකයා හට නිවන්පුර සිරිදුන් සෙසු බොහෝ දේශනාතබා සුවිස්තැනක වැඩහිඳ සුවිසි ධර්මදේශනාවක් කොට සුවිසි අසංඛ්‍යයක් සත්වයන්ට අමාමහනිවන් සිරිදී වදාළ සර්වඥයන් වහන්සේ—

"තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං යෙසච මයං පරිභුඤ්ජිස්සාම චීවර පිණ්ඩපාත සෙනාසන

ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං තෙසං තෙකා ර මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා. අම්හාකං වෙ වායං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සන්ති සඵලා අල මෙව අප්පමාදෙන සම්පාදෙතුන්ති---

එහෙයින් මහණෙනි මේ ජිනශාසනයෙහි අභිද්ධජය දරන්නාවූ තොපවිසින් මෙසේ හික්මිය යුක්තේය, අපි යම් ශ්‍රද්ධාවන්ත ගෘහස්ථකෙනෙකුන් ගේ චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය බෙහෙත් පිරිකර වලදන්නමෝද,ඔවුන්ගේ ඒ සත්කා ර මහත්ඵලවේද්ද, මහානිසංස වේද්ද, අපගේ මේ ප්‍රව්‍රජ්‍යාවත් සිස්නොවේද, ස්වර්ගමොක්‍ෂසම්පත් ලැබී මෙන් සඵලවේද, ස්වර්ගමොක්‍ෂ සැපතට කැඳවීමෙන් සුඛදායක වේද,මෙසේ මහණෙනි තොපවිසින් හික්මි ය යුක්තේය. මහණෙනි ආත්මාර්ථයහෝ බලන්නවුන් විසින් අප්‍රමාදව සීලසමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්‍ෂාව සම්පාදනයකරන්නට සුදුසුවන්නේය. පරාර්ථයහෝ මහණෙනි බලනනවුන් විසින්ද, ආත්මාර්ථ පරාර්ථ දෙකමහෝ මහණෙනි බලන්නවුන් විසන්ද, සීලස මාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්‍ෂාව අප්‍රමාදව සම්පාදනය කරන්ට සුදුසු වන්නේයයි වදාරණලද්දේය.

තමුන්ගේහා ප්‍රත්‍යයදායකයින්ගේද, ස්වර්ගමොක්‍ෂ සම්පත් සංඛ්‍යාත ආත්මාර්ථ පරාර්ථ සෑදීමට භික්‍ෂූ න්විසින් අප්‍රමාදව සම්පාදනය කටයුතුයයි බුදුන් වදාල සීලසමාධි ප්‍රඥාසංඛ්‍යාත තුන්වැදෑරුම්වූ ප්‍රති පත්ති අතුරෙන් පළමුවන සීලමය ප්‍රතිපත්තියම විස්තර මධ්‍යමහැර සංක්‍ෂෙපයක් දක්වනු ලැබේ–

මේ කෙසේදයත්

චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් ද්විවිධවූ අනාචාර ආචාර අ

ගෝචර ගෝචර වශයෙන් සතර ප්‍රභෙදයක් ඇති
සප්තාපත්තිස්කන්ධයන්ගේ සුඛකිරීම් වශයෙන් පව
ත්නා ප්‍රාතිමොක්ෂ සංවර සීලයද, චක්ෂුරාදි සදොරට
හමුවූ ඉෂ්ටාරම්මණයෙහි ලොභාදිය නොඉපදවීම්
වශයෙන් ඉන්ද්‍රියසංවර සීලයද, අනෙසනාදියෙන්
තොරව බුද්ධානුබුද්ධ ශ්‍රාවකාදීන් විසින් පසස්නාලද
දැහැමින් පසෙවීම් සංඛ්‍යාත ආජීවපාරිශුද්ධි සීලයද,
පස්විනා පසෙවීම් වශයෙන් ප්‍රත්‍යයසන්නිශ්‍රිත සී
ලයද; යන මේ සංක්ෂෙපයෙන් දක්වූ සතරසං
වරසීලය විස්තරහෙයින් ප්‍රාතිමොක්ෂ සංවර සීල
යෙහි පිහිටිය වුන් සතර අපායෙන්හා ජාතිජරා මර
ණාදිවූ සංසාර දුකින් මුදා ස්වර්ගමොක්ෂ සම්පත්හි
පිහිටුවනහෙයින් ප්‍රාතිමොක්ෂ සංවරසීලයනම් වේ-

එහි අනාචාරයහා ආචාරය කිමෙක්ද? අගොච
රයහා ගොචරය කිමෙක්ද? සීලයහා ආනිසංසය
කිමෙක්ද? දුස්සීලතාවයහා ආදීනව කිමෙක්ද? ඒ
මේ මතු දක්වන ක්‍රමයෙන් දතයුතු—

“ආචාරගොචරසම්පන්නොඅත්ථිආචාරොඅත්ථිඅනාචා
රො”–පෙ–යනාදීන් කායද්වාරයෙන් සිදුවන ත්‍රිවිධකා
ය දුශ්චරිතයහා වාග්ද්වාරයෙන් සිදුවන චතුර්විධ වා
ග්දුශ්චරිතද කාය වාග්ද්වාර දෙකින්ම සිදුවන සියලු
දුශ්චරිතකිරීම් අනාචාරනම් වෙයි. සියලු දුස්සීල්‍යයම
අනාචාරනම්,

මේ ශාසනයෙහි ඇතම් භික්ෂුවක් ප්‍රත්‍යය උපද
වනපිණිස මිනිසුන්ට ප්‍රයොජනවත්වූ හුනදඬුදීමෙ
න්හෝ තල්තලආදී පත්‍ර දීමෙන්හෝ සපු දුනුකේ
කණේරු ආදී මල් දීමෙන්හෝ කොස් පොල් පුහුල්
ආදී ඵල දීමෙන්හෝ ඇඟ ඉලීමට සුදුසු සුනු දීමෙන්
හෝ තමා දාසයෙකුසේ නීචස්ථානයෙහ තබා ප්‍රිය

කම්‍යතාවෙන්හෝ අනුන් උසස්කොට බණන ලාමක වෘත්තියෙන්හෝ මුගගසූපයක්වැනි සැබෑ බොරු මිශ්‍ර කථාවෙන්හෝ ගිහින්ගේ දරුවන් වැඩීමෙන් හෝ ගිහින්ගේ පත්හසුන්ගෙණ ග්‍රාමාන්තර දේශාන්තර යන හසුන් මෙහෙවරින්හෝ ගිහින්ගේ හසුන්ගෙන ගමින්ගමට යන පා මෙහෙවරින්හෝ වෛද්‍ය නක්‍ෂත්‍ර භාණ්ඩාගාරික වස්තු ගොපනාදීයෙන්හෝ එක්ගෙයකින් ලත්දෙය අනික්ගෙයකට දීම්සංඛ්‍යාත පිණ්ඩ ප්‍රතිපිණ්ඩයෙන්හෝ ආමිෂයක් දුන්නන්ට තෙමේත් ආමිසදීම්සංඛ්‍යාත දූතානුප්‍රදනාදී බුදුන්විසින් ගර්හාකොට හරණලද මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරේද, මේ අනාචාරයයි දතයුතු-

“තත්ථ කතමො ආචාරො කායිකො අවීතික්කමො”—පෙ—ආචාරය කිමයත් ත්‍රිවිධකාය දුශ්චරිත නොකිරීමය චතුර්විධ වාග්දුශ්චරිත නොබිණීමය කාය වාක් දුශ්චරිත දෙකම නොකිරීමය යන මේ ආචාරනම් චේ-ප්‍රත්‍යය උපදවන පිණ්ඩිය හුණදඬුදීම් ආදිවූ යට කියනලද සියලු අනාචාරයෙන් දුරුවීම හා සියලු සුචරිත පිරීම ආචාරනමැයි මෙසේ ආචාරය දතයුතු—

තත්ථ කතමො අගොචරො ඉධෙකච්චො වෙසියගොචරොවා හොති—පෙ—යන්නේයි අගොචරනම් කවරයත්? ඇතම් භික්‍ෂුවක් ශ්‍රමණබවට අන්තරායකරබැවිනුදු පිරිසිදු ආශ්වාස ඇත්තවුන්ට ගර්හාවට යෙත්තුවන බැවිනුදු නොඑලෙඹියයුතුයයි කියනලද වෙශ්‍යාවන් ගොචරකොට ඇත්තේවේද, වඳබුවන් මලසැමියන් බැහැරගිය සැමියන් ඇත්තවුන් ගෝචරකොට ඇත්තේද, ස්වාමිකුලයට නොගොස් ගෙයි වැඩෙන මහලු කුමරියයි කියනලද ථුල්ල කුමාරිකා

වන් ගොචරකොට ඇත්තේවේද, උත්සන්නවූ අවූපශාන්ත කෙලෙස් ඇතිබැවින්ද, ලොකාමිසකථා බහුල හෙයින්ද, නොඑලඹිය යුතුයයි කියනලද පණ්ඩකයන් ගොචරකොට ඇත්තේවේද, මෙහෙයින් උත්සන්න බ්‍රහ්මචර්යා ඇතිබැවින් මහණුදු එසේම බැවින් එක්වන් එලඹීමෙහි බ්‍රහ්මචර්‍ය්‍යාන්තරාය වියහැකි බැවින් නොඑලඹිය යුතුයයි කියනලද, මෙහෙයින් ගෝචර කොටඇත්තේවේද, රාසොඬුන් අවිච්ඡින්නහෙයින් බ්‍රහ්ම චරියාන්තරාය කරබැවින් සුරා සාලාවට නොඑලඹියයුතුයයි කියනලද, පානාගාර ගොචරකොට ඇත්තේවේද, රාජරාජ මහාමාත්‍යයන්හා තීර්ථකයන් සමගද, ඒ තීර්ථකයින් කෙරෙහි භක්තිඇති ප්‍රත්‍යදූසක ශ්‍රාවකයන් සමගද, ත්‍රිවිධ ශික්ෂාවන්ට විපක්ෂවූ සංසර්ගයෙන් යුක්තව වෙසේද,

යම් කුලකෙනෙක් බුද්ධාදීන්කෙරෙහි ශ්‍රද්ධා නැතිහෙයින් අප්‍රසන්නවූ හෙවත් කර්මඵල ශ්‍රද්ධා නැත්තෙන් අශ්‍රද්ධාවූ රත්නත්‍රයෙහි ප්‍රසාද නැත්තෙන් අප්‍රසන්නවූද, දශාක්‍රොශ වස්තුවෙන් ඝස දුක්විමෙන් සන්තාජිනය කෙරෙද්ද, අනර්ථ කැමතිවෙද්ද, අහිත කැමතිවෙද්ද, අයොගක්ෂෙම කැමතිවෙද්ද, භය කැමතිවෙද්ද, භික්ෂුභික්ෂුනී උපාසක උපාසිකා යන සිව් පිරිසට අනර්ථාදිය කැමතිවෙද්ද, එබදු කුලයන් සෙවිද, උන්නිස්‍රා ජීවත්වේද, උන්කරා එලඹීමෙන් භජනය කෙරේද, නැවත නැවත යාමෙන් පයිරුපාසනය කෙරේද, මේ සියල්ලම අගොචරයයි වදාලසේක — මෙහි පංචකාමගුණ නිශ්‍රයබැවින් ශ්‍රමණධර්මයට අනුප නිශ්‍රයවූ වෙශ්‍යාදීන්ද, ලාභ සත්කාර නැමති අසත්පාතයට හේතුවනබැවින් රජදරුවන්හා මහාමාත්‍යයන්ද, දෘෂ්ටිවිපත්තියට හේතුවනබැවින් තීර්ථකයන්හා ශ්‍රාවකයන්ද, ශ්‍රද්ධාහානි වීමත්හෙදූ

දිය ඵලවනබැවින් අශුඩ්ධාදි කුලයන්ද, අගොචරනම් වෙත්සි දතයුතු:-

“තත්ථ කතමො ගොචරො ඉධෙකච්චො න වෙසියගොචරො හොති—පෙ—යන දෙශනයින් අගොචර නිර්දේශයෙහි අගොචරයයි දැක්වූ වෙශ්‍යාවිධව ථුල්ලකුමාරික පණ්ඩක භික්ෂුණී පානාගාර රාජරාජ මහාමාත්‍ය තීර්ථක ·තීර්ථක ශ්‍රාවකයන දස අගොචරයෙහි නොහැසිර භජන පයුරුපාසනාදිය නොකොට යම් ඒ කුලයෙක් අශුඩ්ධාදි දෙෂයෙන් තොරව සිව්වනක් පිරිසට වැඩකිමුත් අවැඩත් නොකමැතිවේද, බුඩ්ධාදීන්කෙරෙහි ශ්‍රද්ධාවෙන් ප්‍රසන්නවේද, හෙවත් කම්ඵල ඇදහීම් ඇතිව රත්නත්‍රයෙහි ප්‍රසන්නද, දසඅක්‍රොශ වස්තූන්වන් හයදක්වා සන්තර්ජනය නොකෙරේද, අර්ථයක්ම හිතයක්ම යොගක්ෂෙමයුක්ම අභයක්ම කැමතිවේද, සිව්පිරිසට වැඩකැමතිවේද, සංඝයාට සතරමන්සන්ධියෙහි තුබූ උදපාණයක්වැනිද, ස්වර්ණ ආලොකයෙන් බබලාද, ගෙට යනඑන භික්ෂුභික්ෂුණී සංඛ්‍යාත සෘෂීන්ගේ චීවර සම්මිශ්‍රජනප්‍රසාරණ වාතයෙන් යුක්තද; එබඳු කුලයන්නිසා ජීවත්වේද, භජන පයුරුපාසනාදිය කෙරේද, මේ ගොචරනම් වන්නේය.

“දුවිධො හි අනාචාරො කායිකො වාචසිකො ච—පෙ—යනුයෙන් කායික අනාචාරය වාචසික අනාචාරයයි ද්විධා අනාචාරය විප්‍රකාරවේ-එයින් කායික අනාචාරයනම් කවරයත්--ඇතැම් භික්ෂුවෙක් සංඝ සන්නිපාතයට පැමිණියේද, නොකරණලද ගෞරවඇතිව ස්ථවිර භික්ෂූන් සිවුරෙන්හෝ ශරීරයෙන් ඝට්ටමින් සිටිනේද, ඝට්ටමින් හිඳිනේද, ඉදිරියෙහි සිටිනේද, ඉතුයෙහි සිටින්නාක්මෙන් ගෞරව

නැතිව සිටිනේද, එසේම ගෞරව නැතිව ඉදිරියෙහි හිඳිද, උස්තැන හිඳිද, හිසවසා පෙරවා හිඳී, ආසන්නතැනසිට බෙණේද, අත වනවනා බෙණේද, ස්ථවිරභික්ෂූන් වහන්නැතිව සක්මන්කරද්දී වහන්නැති සක්මන් කෙරේද, ස්ථවිර භික්ෂූන්ට ආසන්නව සිටිද, බාල භික්ෂූන් අස්නෙහි නගා පිළිබඳාද, ගිණිහල්ගෙහි ස්ථවිර භික්ෂූන් නොවිචාර ගිනිදල්වාද, දොරවසාද, පැන්තොටෙහි ස්ථවිරභික්ෂූන් සට්මින් බසිද, ඉදිරිව නැගේද, ගැටමින් නහාද, ඉදිරිව නහාද, සවමින් නැගේද ඉදිරිව නැගේද, ඇතුල්ගමට වදනේ ස්ථවිර භික්ෂූන් සටමින් යේද, ඉදිරිවයේද, පලමුකොටයේද, කුලවැස්සන්ගේ යම් ගැබිසංවෘත ගෙවල් ආදියක කඩනරාදියකින් මුවාවූ ගෙදොරක කුලස්ත්‍රීහු කුමාරිහු හිඳිද්ද, එහි වදනේද, කුමරුවන්ගේහිස පිරිමදිද, මේ කායික අනාචාරනම් වේ.

වාචසික අනාචාරයනම් කවරයත්—මෙහි ඇතම් සඟකෙනෙක් ගෞරව නැතිව ස්ථවිර භික්ෂූන් නොවිචාරා බණ කියාද, පැන විසඳාද, පාමොක්උදෙසාද, නොනැමීසිට බෙණේද, අත වනවනා බෙණේද, ඇතුළුගමට වන්නේද, ස්ත්‍රියකට මෙනාම්ඇත්තිය මෙනම් ගෝත්‍රඇත්තිය ක්මෙන් ඇඳද, කැඳඇඳද, බත්ඇඳද, කැවුම්ඇඳද. කුමක් බොන්නමොද, කුමක්වලඳමොද, කුමක් දේසි දෙඩාද, මේතෙම වාචසික අනාචාරයයි කියතලැබේ. ආචාරයවනාහි මෙයට ප්‍රතිපක්ෂවශයෙන් වෙදිතව්‍යයි,

"භික්ඛු සගාරවො සප්පතිස්සො හිරොත්තප්ප සම්පන්නො සුනිවත්‍ථො සුපාරුතො"—පෙ—යනුවෙන් මහණනම් ශුඞ්ාදිගුන හේතුකොටඇති ගෞරවයෙන් යුක්තවූයේ ගරුස්ථානයෙහි ගෞරව සාරා

ද්‍යාදි වශයෙන් ප්‍රතිශ්‍රව සහිතවූ ශ් හෙවත් ගරුස්ථා නයෙහි නීච වෘත්ති ඇත්තේ හිරිඔතප්දෙකින් යුක්ත වූයේ ශේඛියා ධර්මපාරිපූරිවශයෙන් මනාකොට හැඳ පෙරව ප්‍රාසාද එළවන ගමන්ඇතියේ ඉදිරිබලන බැළුම් නැත්තේ අනුදිග බැළුම් නැත් තේ හස්තපාද හැකිලිම් දික්කිරීම් නැත්තේ නොයෙ ක්දිග නොබලා යුගමාත්‍ර දර්ශනවශයෙන් යටහෙළූ ඇස්ඇති ප්‍රසාදකර ඉර්යවූ ඇතිවනබැවින් සම්පූර්ණ වූ ඉරියවු ඇත්තේ පඤ්චෙන්ද්‍රියයන් කෙරෙහි සුසං වෘත රක්‍ෂාඇත්තේ පරිගුප්තවූහෙයින් භොජන සංඥවූ චතුර්විධ ප්‍රත්‍යයෙහි පයෙෂ්සන ප්‍රතිග්‍රහ ණ පරිභොගාදීන් විසින් සවිකාරයෙන් ප්‍රමාණඥත් ගේ භාවනා මනස්කාර සංඛ්‍යාත 'ජාගරියෙහි යුක්ත ප්‍රයුක්තවූයේ චතුර්විධ සම්ප්‍රජන්‍ය සංඛ්‍යාත සිහිනුව නින් යුක්තවූයේ අල්පේච්ඡ සන්තුෂ්ටි ඇත්තේ වැ ඩූ වීර්යඇත්තේ ආභිසමාචාරික සිලයෙහි සත්කෘත්‍ය කාරීව ආදරකරන්නේ ගුරුස්ථානයෙහි ආදර බහුල වූයේ වෙසේද මෙසේ මේ ගාරවාදිය අනාචාර කාමයන් විසින් අවර්තවූබැවින් ආචාරයයි කියන ලදී.

ගොචරොපන තිවිධොහොති උපනිස්සය ගොච රො ආරක්ඛ ගොචරො උපනිබන්ධ ගොචරො ති —පෙ— යනුයෙන් ගොචරය වනාහි ත්‍රිවිධවෙයි, ඉන් කවරේද? උපනිශ්‍රය ගොචරය, ස්මෘතිසංඛ්‍යාත වූ සිතට ආරක්‍ෂාගොචරය, කර්මස්ථානසංඛ්‍යාතවූ සිත් හි උපනිබන්ධ ගොචරය යන මොහුයි.

එහි උපනිශ්‍රය ගොචරයනම් කවරේද? අල්පේච්ඡ තාදිවූ දසකථාවන්ට පිහිටවූ ගුණඇති කල්‍යාණමිත්‍ර තෙම උපනිශ්‍රය ගොචරයනම් වේ. යම් කල්‍යාණමි

ත්‍රියෙකුනිසා පෙර නොඇසූ සූත්‍රගෙයාදි ධර්මයන් අසනුලැබේද ඇසූදෙය නැවත නැවත පරිපුච්ඡාවෙන් සාකච්ඡාවෙන් ඇසීමෙන් පිරිසිදුවේද ශ්‍රැත ස්ථානයෙහි සැකදුරුවේද කර්මඵලයෙහි සම්‍යක්දෘෂ්ටිය සෘජුකිරීම්වශයෙන් දෘෂ්ටිය ඍජුකෙරේද එහි ශ්‍රද්ධාවෙන සිත් පහදවාද යම් ගුරුස්ථානයක් අනුව භික්මෙන්නේ ශ්‍රද්ධාසීල ශ්‍රැතත්‍යාගාදිගුනයෙන්හා අගතියෙන් දුරුව බුද්ධධර්මයට එකගවූ ශාසනයෙහි විශ්වාස වඩන්නාවූ භික්ෂූන් කෙරෙත් භික්මෙන්නේ නම් වේසි.

---

සිල්වත්ව සිටත් කුකුලෙකු පිහාපහරණ පමණ අනිත්‍ය දුක්ඛ අනාත්මයයි නොසිතන්නාවූ පුද්ගලතෙම ත්‍රිපිටක බුද්ධවචනය බොහෝකොට කියන්නේද (නොහොත්) ත්‍රිපිටක බුද්ධවචනය උගෙණ සූත්‍රානුමෝදනා වශයෙන්ද රාත්‍රික ධර්මදේශනා වශයෙන්ද අනුන්ට කියන්නේවී නමුත් පුද්ගලයා විසින් සම්භාවිතානුයෝගයෙක් කටයුතුද ඒ නොකරන්නේ වීනම් අනුන්ගේ ගෙරින් රක්නාවූ ගොපල්ලාමෙන් (හෙවත්) අනුන්ගේ ගෙරි පාවාගෙණ දවස මුලුල්ලෙහි රැකබලා කවාගෙණවුත් සවස හිමියන්ට ගැණපාවාදීලා තමාවිසින් ලැබියයුතු දවසබැලපමණක් ලැබ ජීවත්වූ පස්ගෝරසයටද ගවගත්වද හිමිනොවන්නාවූ ගොපල්ලාමෙන් සතරමග සතරඵලයයි කියනලද ගුණයට හිමිනොවන්නේය අනවැස්සන්කෙරෙන් උත් කරුණාවක් නැත්තේයි—

එකුද්දනිය ස්ථවිරයන්මෙන් ත්‍රිපිටක බුද්ධවචනයෙන් එක ගාථාවක්නමුත් ධර්මදේශනා වශයෙන් අනුන්ට කියන්නාවූ පුද්ගලතෙම, වේ,ඉදින් සතරමග සතරඵල නිවණැයි කියනලද නවලෝකෝත්තර ධර්ම

යට කිම්වත්නේයි. කාමරාග රූපරාග අරූපරාගයයි කියන ත්‍රිවිධවූ රාගයවද කැමති නොවන්නාවූ භික්ෂුහු නිවනට පිළිපන්නේයි. යම්කිසි අරමුණක් විෂය කොටහෝ ගැටෙමින් උපදනාරාගයෙන්ද ද්වේෂයෙන්ද මොහයෙන්ද යනාදී වශයෙන් සංඥාවිපර්‍යාස චිත්ත විපර්‍යාසවශයෙන් තමාගේ සිත කය වෙනස නොවන්නාවූ යම් භික්ෂුවක් ඇද්ද ඒ භික්ෂුව දුක්ඛ සත්‍ය සමුදය සත්‍ය නිරොධ සත්‍යයයි කියන චතුරාර්‍ය්‍යසත්‍ය අවබොධකෙරීමට විදර්ශනාවඩන්නෙක්වෙයි. සංසාර දෝසයෙන් නිදහස්වීමට බලාපොරොත්තුව සිටින සත්ත්වයින්ට පිහිටදවෙයි-

සීලව්‍රත ධුතාංගව්‍රතයෙන් විරහිතවූ බොරු කියන්නාවූ පුද්ගලතෙම හිසමුඩු පමණකින් ශ්‍රමණනම් නොවෙයි. ඉච්ඡාලෝභාදී අරමුණෙහි යෙදී වාසය කරන්නාවූ භික්ෂූහු කෙසේ ශ්‍රමණයො වේද, නොවේමය. ලෝභ ද්වේෂ මොහ නූපදවා ලෝභාදී පාප ධර්මයන් කෙරෙන් තමාගේ සිතරැකී වාසයකරන්නාවූ භික්ෂූන්කෙරෙන් වාසය කිරීම යහපත, ඒ චක්ෂුද්වාරයට රූපාලම්බනයක් හමුවූ කල්හි යෝනිසෝමනස්කාරය පැවැත්වීමෙන් ලෝභ ද්වේෂ මෝහ නූපදවා ලෝභාදී පාපධර්මයන් කෙරෙන් තමාගේ සිතරැකී වාසයකන්නාවූ භික්ෂූන් කෙරෙන් වාසය කිරීම යහපත, කායද්වාරයට ස්පෘෂ්ට ව්‍යාලම්බණයක් හමුවූකල්හි යෝනිසෝ මනස්කාරය පැවැත්වීමෙන් ලෝභ ද්වේෂ මොහ නූපදවා ලෝභාදී පාපධර්මයන් කෙරෙන් තමාගෙ සිත රැක්මද කායවිඥප්තියයි කියනලද කායද්වාරයෙන් සිඳුවන ප්‍රාණවධ අදත්තාදාන කාම මිථ්‍යාචාරයෙන් දුරුව තමාගේ සිල්රැක්ම යහපත, වචී විඥප්තියයි කියනලද වචීද්වාරයෙන්


සිඹවන මෘෂාවාද පෛශුන්‍ය පරුෂ වචන සම්ප්‍රලාපයෙන් දුරුව තමාගේ සිතරැක්ම යහපත (භාවාහයසි) කියනලද මනෝද්වාරයෙන් සිඹවන අභිද්‍යාව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටියෙන් දුරුව තමාගේ සිත රැක්ම යහපත, සියලු සංවරයහා චක්ෂුරාදි සදොරම රක්ෂාකිරීමේ සිත්ඇති යම් භික්ෂුවක් ඇද්ද ඒ භික්ෂුව සියලු සංසාර දුක්ඛයෙන් මිදීමට ස්වරූප ඇත්තෙක්ද වෙයි.

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි, සිහිකරනනාවූ භික්ෂුහු පරහට අක්‍රොශාදි වශයෙන කයින්, වචසින්, මණසින් උපඝාතයක් නොකරීමද, ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි, සංවරයද, ( හෙවත් ) රක්ෂාවද; ආහාරයෙහි; ප්‍රමාණය දනනාබවද, ( හෙවත් ) පිළිගැන්මෙහිද වැලදිමෙහිද පරහටදීමෙහිද පමණ දනනාබවද, ( නොහොත් ) දැහැමින් සෙමින් උපන් සතර පසය පස්විකා වළදනබවද ( හෙවත් ) රැස් කිරීමට ආධාරව සිටිනනාවූ සතරතන්හුප්පාදයෙන් වෙන්ව ශූන්‍යාගාරවල්හි සෙනස්නෙහි ඇල්මද, ක්ලෙශ මාරයාගෙන් ජයගැනීමට උඩාවීයසී වඩනනාවූ භික්ෂුහු ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට සතතයෙන් පිළිපැදීමය මේ සියල්ල සියලු බුදුවරයන් ගේ, අනුශාසනායි,

ගුරුබුර, විදශීනාධුර ( යන්නෙන් ) වදාලබැවින් මෙම පොතේ ඉහතන් දැක්වූ ක්‍රමයට පිළිපනනාවූ භික්ෂූහු සිවුපසයට සුදුසුමය.

“ම තු ස ම් බ න් ධ යි”

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු